DOCUMENT RESUME

ED 127 807 FL 007 949

AUTHOR Gair, James W.; Karunatilaka, W. S.
TITLE Samples of Contemporary Sinhala Prose with Glossary and Brief Grammatical Notes.
INSTITUTION Cornell Univ., Ithaca, N.Y. Dept. of Modern Language and Linguistics.
SPONS AGENCY Office of Education (DHEW), Washington, D.C.
BUREAU NO BR-2-2055
PUB DATE 76
CONTRACT OEC-0-72-1106
NOTE 57p.; For related documents, see ED 091 935 and FL 007 950

EDRS PRICE MF-$0.83 HC-$3.50 Plus Postage.
DESCRIPTORS *Grammar; *Instructional Materials; *Language Instruction; Language Styles; Language Usage; *Literary Styles; Prose; Reading Instruction; *Reading Materials; Second Language Learning; *Singhalese
IDENTIFIERS National Defense Education Act Title VI; NDEA Title VI

ABSTRACT

This collection of twenty-seven short readings is intended to augment the readings in the authors' previous work, "Literary Sinhala" (1974). These selections are intended to serve as further exemplification of the grammatical material in that text. The selections here are mostly contemporary prose in several styles, ranging from fiction to philosophical works, but excluding newspapers. Brief grammatical notes are given, and forms glossed, for material not covered in the previous work. (CFM)

****
* Documents acquired by ERIC include many informal unpublished *
* materials not available from other sources. ERIC makes every effort *
* to obtain the best copy available. Nevertheless, items of marginal *
* reproducibility are often encountered and this affects the quality *
* of the microfiche and hardcopy reproductions ERIC makes available *
* via the ERIC Document Reproduction Service (EDRS). EDRS is not *
* responsible for the quality of the original document. Reproductions *
* supplied by EDRS are the best that can be made from the original. *
****

TITLE VI, NDEA, SEC. 602
Contract No. OEC-0-72-1106
Project No. 2-2055

ED 127807

SAMPLES OF CONTEMPORARY SINHALA PROSE

with Glossary and Brief Grammatical Notes

James W. Gair

W. S. Karunatilaka

U S DEPARTMENT OF HEALTH, EDUCATION & WELFARE
NATIONAL INSTITUTE OF EDUCATION

THIS DOCUMENT HAS BEEN REPRODUCED EXACTLY AS RECEIVED FROM THE PERSON OR ORGANIZATION ORIGINATING IT. POINTS OF VIEW OR OPINIONS STATED DO NOT NECESSARILY REPRESENT OFFICIAL NATIONAL INSTITUTE OF EDUCATION POSITION OR POLICY

FL007949

South Asia Program
and
Department of Modern Languages and Linguistics
Cornell University
Ithaca, New York
1976

2

SAMPLES OF CONTEMPORARY SINHALA PROSE
with Glossary and Brief Grammatical Notes

James W. Gair
W. S. Karunatilaka

South Asia Program
and
Department of Modern Languages and Linguistics
Cornell University
Ithaca, New York

1976

3

The research reported herein was performed pursuant to a contract with the United States Office of Education, Department of Health, Education, and Welfare under the authority of Title 6, NDEA.

PREFACE

The following twenty-seven short readings and glossary are intended to augment the readings in our Literary Sinhala (South Asia Program and Department of Modern Languages and Linguistics, Cornell, 1974). These selections are intended to serve as further exemplification of the grammatical material in that text, largely as represented in contemporary prose of several styles, ranging from fiction to philosophical works (but excluding newspapers, for which we expect to prepare special materials). Although brief, these selections should serve as useful supplemental material for the student who has progressed to the last few lessons of Literary Sinhala, by furnishing further practice and a clearer notion of the range of contemporary prose.

Brief grammatical notes are given where necessitated by usages that are not covered in Literary Sinhala. A single consolidated glossary is given for all the selections, since this will simulate using a dictionary better than lesson-by-lesson glossaries will. Forms are glossed only if they do not appear in Literary Sinhala (or in Colloquial Sinhalese, which was a prerequisite to the latter).

We would like to acknowledge the indispensable help given by Heloise Perera, who typed the Sinhala, Gregory Pearson, who bore a great deal of the responsibility for the final format, and Patricia Mason, who typed the English portion of the glossary.

Thanks are once more due to the Office of Education, who made this modest work financially possible, and especially to Mrs. Julia Petrov of that office.

James W. Gair
W. S. Karunatilaka

Ithaca, New York, U.S.A.
and
Kelaniya, Sri Lanka

March, 1976

1

" ප්‍රදීන තුමේදී පද්මිනී කෙරෙහි ප්‍රේමයක් ඇතිකරගත් කථාන්තර ජෝන් ජයසේකර පාඨශාලාවෙන් අස්ව ධනය සපයන පිණිස කල්පනා කෙළේය. ජයසේකරගේ පියා කලින් ධනවංතයෙක්ව සිටි නමුත් මෑතකාලයේ නිධීන වීය. තරුණ ජයසේකර උත්සාහවත් අභිවාඩිකාමී කෙනෙකි. එහෙත් විසි ඇවිරිදි වන ඔහුගේ හදය මුහුකුරා ගොස් නැති බැවින් ධනය සැපයීමට බසින්නට තවම කාලය නොවන බැව් පියා තව මොහොතක් ඉගෙනගන්නට යයි පියා නියම කෙළේය. එබස් ඇසූ තරුණ ජයසේකර පියාට බලවත් ගෞරව කරන්නෙක් වුවද, තමාගේ ඔහේ ඇති උත්සාහවත් භාවය නිසා රජෙකුවක් සොයන්නට කැමැතිබව කීවේය. එවිට මහලු ජයසේකර රාළහාමි මෙම උපදේශය නීය. "

(පියදාස සිරිසේන , ශ්‍රී ලංකාමාතා , මරියන්ටල් මුද්‍රණාලය , 3 වන මුද්‍රණය, 1957, මරදාන. 28 වන පිටුව.)

" ථිපිය අටුවා ගැටපදය හදුනාගැනීමට නම් එහි ඉරුපොත වන ථමෝ පදවඩනථාවත් හදුනාගතයුතු හෙයින් අපි පළමුකොටම ථම පදවඩනථාව කෙටියෙන් හදුන්වන්නට වෑයම් කරමු.

පෙළබසින් සැපැයුණු බණපොත් අතුරෙන් ජාතක අටුවාවට ලැබුණු ජනාදරය අනෙක් කිසි පොතකට නොලැබුනේය. අනාගතය සඩඪයෙහුත් එසේම කියැ[1] හැකිය. ශ්‍රාවක අනාථපිණ්ඩිකයෙහිදී අසිමටම නැතිවැ යන්නේත් ඒ පොත හෙයිනි. පරපුරෙන් පරපුරට පවත්වනු පිණිස සිංහල ගණාචාර්වරයනු හට භාරවුණු පොතත් සිංහල ජාතක පොතම ය. ජාතක පොතට දෙවැනිවැ සිංහලයන්ගේ විශේෂයෙන් ථේරවාදීන්ගේ ආදරය දිනාගත් ග්‍රන්ථය වශයෙන් දීපිපියා අටුවාව ඉදිරිපත් කළ හැකිය. "

(මැදඋයන්ගොඩ විමලකීර්ති සාවිර, ථිපිය අටුවා ගැටපදය (සංස්කරණය) 1960
සීමාසහිත ගුණසේන සහ සමාගම , කොළඹ. ප්‍රකාශනය.)

1. අැ for final -ඇ is found particularly in past participles, in some older texts, and in some newer ones written in imitation of them. Hence කියැ here and නැතිවැ and දෙවැනිවැ later on for කිය, නැතිව and දෙවැනිව.

" පරාධීන අවධියේ සිටි පියදාස සිරිසේන (1875-1946) මහතා සිංහල ලේඛකයකු වශයෙන් මහත් දුෂ්කරතා හා අවහිර මැද තරන්නට යෙදුණු සේවාවේ අගය සාධීන අවධියේ මෙරට වෙසෙන ජනතාවට වැටහීයාම පුදා ඇතැයි. එය සාහිත්‍යාභිලාෂී සියලුම සිංහලයන්ගේ ප්‍රසාදයට හේතුවන්නකි. ඔහු පහළ වූයේ ගම්බද පෙදෙසක ය. 1875 දිය. ඉඳුරුවේ අතුරුවැල්ල ඔහු උපන් ගමයි. ඔහුගේ පියා බාලවියෙහිම මියගිය හෙයින් ඔහුගේ දිවුණුව උදෙසා ක්‍රියාකළේ මෑණියන්දෑ,[1] වැඩිමහල් සහෝදරයන් හා ඥාතිවරුන් ය. පියදාස සිරිසේන මහතා ළදරුවියෙහි මහත් වියපිරියෙන් මහා ටෙයිපියෙන් ක්‍රියාසෙට සහා සාහිත්‍ය කිපයක මහත් පටුත්වයක් ලත් සිංහල ලේඛකයෙක් වූයේය. නවකතාමෙහිද කථාඇවැත්වීමෙහිද ග්‍රන්ථ නිෂ්පාදනයෙහිද ඔහුගේ සාමර්ථ්‍යය විශිෂ්ට ය."

(සාහිත්‍යය (සඟරාව) අංක 1 , ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය , 1964, කොළඹ. පතෘවාක්‍යය.)

1. දෑ is an honorific affix, now rarely used.

4

"ලංකාවේ දේශපාලන පක්ෂවල දියුණුව ඇතිවුයේ ඩොනමෝර් ආණ්ඩු කුමයෙන් පසුව ය. මේ රටේ ඉංග්‍රීසි උගත් මධ්‍යම පවිත්‍රය ඇතිවීමත් සමඟම බටහිර රටවල ඇති ක්‍රමයත්, ඒ රටවල දේශපාලන චින්තකයන්ගේ මතයනුත් ක්‍රමයෙන් දැනගත් ලාඩ්කිනයෝ මේ රටේද දේශපාලන බලය සියතට ගැනීමේ පරමාර්ථයෙන් ජාතික සංගම් කිපයක්ම ඒ කාලයේදී ආරම්භ කරන ලදී. එයින් වැදගත් තැනක් ගත්තේ සිංහල මහා සභාව, ද්‍රවිඩ සංගමය, මුස්ලිම් සංගමය සහ යුරෝපීය සංගමය යි. මේ සංවිධාන ප්‍රධාන වශයෙන්ම ජාතිවාදී සංවිධානය. ඔවුන්ගේ එකම ඉල්ලීම වුයේ මේ රටට යම් තරමක නිදහසක් ලබාගැනීම ය. බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව සම්පූර්ණ නිදහස් ව්‍යාපාරයන් ගෙනයාමට උවමනාකර නොසිතුණේ ඔවුන්ගේම මධ්‍යම පංක්තික ප්‍රතිපත්ති නිසාය."

(අයි. කේ. විරවර්ධන, රජය හා සමාජය, සීමාසහිත ගුණසේන සහ සමාගම, 5 වන මුද්‍රණය, 1966, කොළඹ. 173 වන පිටුව.)

5

"ලෝකයේ ශාසනාචාරුන් අතර වැඩිදෙනා පෙනිසිටියේ අදෘශ්‍යමාන මැවුම්කාර දෙවියෙකුගේ නියෝජිතයකු ලෙසිනි. එහෙත් බුදුන්වහන්සේ ලෝකයා ඉදිරියෙහි පෙනි සිටියේ මනුෂ්‍යයකු ලෙසිනි. අන් බලවතකුගේ නියෝජිතයකු වශයෙන්-දෙවැන්නකු වශයෙන් පෙනි නොසිට තියම මනුෂ්‍ය සවරූපයෙන්ම පෙනි සිටිම උන්වහන්සේ ඇල පැවති ශ්‍රේෂ්ඨ ගුණයකි. උදාර ගතියකි. මේ උන්වහන්සේ ගැන මගේ සිත්හි ගුණයකි.

ලෝකයේ මැවුම්කාර දෙවිවරුත්, ශාසනාචාරුත්, අනිත් උසස් ගැම දෙනමත් තමන්ගේ තත්ත්වයට අනුන් පැමිණීම ගැන කැමති නැත. එසේ පැමිණවීමට උත්සාහ දරාද නැත. එහෙත් බුදුන්වහන්සේ අන්හැම සෙනෙක්ම උන්වහන්සේ වැනි බුදුවරයන් වෙනොත් ඒ තරමට කැමති වුහ. එසේ වන ලෙස දේශනා කළහ. තමන් ලැබූ උසස් තත්ත්වයට අන් හැමෝම පත්කිරීමට උත්සාහ දැරූහ. මොද බුදුන්වහන්සේට පමණක් තිබුණු ශ්‍රේෂ්ඨ ගුණයකි. මෙයින්ද බුදුන්වහන්සේ ගැන මම පැහැදුනෙමි."

(ඨේ ශ්‍රී ආනන්දවංශ , සදධීම සංග්‍රහය, තක්සලා ප්‍රකාශකයෝ , 1960 , මරදාන .
43 වන පිටුව.)

6

" පුරාණ රංගශාලාව, රංගය හෙවත් ප්‍රේක්ෂාගාරය, රංගභූමිය හා නෙපථ්‍යාගාරය වශයෙන් කොටස් තුනකට බෙදූ අයුරු බව පෙනේ. රංගභූමිය යනු රඟමඩල ඇතුළේ ඇති විදිකාවය. මෙයින් පිටපසින් පිහිටා තිබෙන නෙපථ්‍යාගාරය වූ කලී, නළුවන් හා නිළියන් වෙස් වළාගැනීමට පාවිච්චි කරන කාමරයය. නළු නිළියන් රඟ මඩලට පිවිසියේ නෙපථ්‍යාගාරයෙහි සිටය. රඟමඩලට හා නෙපථ්‍යාගාරයට අතරින් ' ජවනිකා ' නමින් හැඳින්වුණු කඩතුරාවක් තිබිණි. රඟමඩලට ඇවිත් රඟපෑමට පෙර, නළු නිළියෝ මේ කඩතුරාවට පුවාව සිටියහ. රංගය හෙවත් ප්‍රේක්ෂාගාරයයි කියනු ලබන්නේ, ප්‍රේක්ෂකයන් (නාට්‍යය නරඹන්නන්) අසුන් ගෙන සිටි තැනට ය. මෙහි පොළොව සෝපානාකෘතියෙන් හෙවත්, රඟමඩල සිට ඇත්වනවිට ක්‍රමයෙන් උස්වන අයුරු සකස් කළ යුතුයයි 'නාට්‍යශාස්ත්‍රයෙහි' එධාන කොට තිබේ. "

(ඊ. ආර්. සරච්චන්ද්‍ර , පියදස නිශ්ශංකගේ මැටිකරත්තය , සමන් මුද්‍රණාලය , 4 වන මුද්‍රණය 1961 , මහරගම. ප්‍රස්තාවනාව , 2 වන පිටුව .)

7

"බුදුන්වහන්සේගේ ප්‍රතිරූපය ඇසට අසුකරන්නට යොදාගත් භාෂා විලාසය විමසා බලන්න. අශ්වඝෝෂ බ්‍යාම ප්‍රභා, කෙතුමාලා සඳහන් කළ විට අසන්නන් අබියස තමන් වෙහෙරවිහාරයෙහි නිරා දැක පුරුදු බුදුරුව මැවී ඉපනේ. බුදුන්ගේ මුවමඩල පුන්සඳට උපමාවන විට එය වඩාලාඹ ප්‍රකටව මනැස අබියස දිස්වෙයි. ' කරකැවී කැවී යුවළ යුවළව ' නිස්මෙන රශ්මි මාලා ගැන සඳහන් කරනවිට ඒවා පිළිබඳ ඊතම විස්තරුපයක් අපට දැකගත නොහැකිද?

අසා රස විඳීමට රචිත ලෙඛනයක කණට මුල් තැන ලැබීම පුදුමයක් නොවේ. බුදුන්වහන්සේ ගැන සඳහන් කිරීමේදී යොදාගත් සාරෝප භාෂා ශෛලිය ඊට උදාහරණයක් නොවන්නේද? "

(නන්දසේන රත්නපාල , <u>සාහිත්‍යවිචාර</u> , රත්න පොත් ප්‍රකාශකයෝ , මරදාන .
117 වන පිටුව .)

8

" ඇතැම් අය බවට පැමිණියාවූද නොඑසේව අතීන්‍ය බාහිර අංග ලෙස පවසින්නාවූද සලකුණු හැම සංස්කෘතියකම වෙයි. සිංහල සංස්කෘතියෙහි එවැනි අංග බොහෝය. ඒ අංගයන්ගෙන් සමහරක් අපට ලැබුණේ සඟ්‍රාජාතීන්ගෙනි ; සමහරක් මිලෙච්ඡයන්ගෙනි ; සමහරක්, සිංහලයන් සකුමණයවන්ට පෙර මෙහි විසූ ආදි මිලෙච්ඡයන්ගෙනි. එහෙත් මෙරටම විසූ ආදි මිලෙච්ඡයන්ගෙන් ලැබුණැයි හැඳින් විය හැකි ලකුණු සිංහල සංස්කෘතියෙහි දුලීභ යයි වැද්දන්ගේත් අපගේත් සිරිත් විරිත් හා විඥාසයන්ද සසඳා බැලූ ඇතැම් මානව විද්‍යාඥයෙක් කිය."

(මාර්ටින් වික්‍රමසිංහ , සිංහල ලකුණ , මවුන්ට් යන්ත්‍රාලය , 1947 , කොළඹ . 43 වන පිටුව .)

9

"යට[1] දැක්වූ විස්තරයෙන් වැඩිකොට ඔප්පුවන්නේ පැරණියන් අතර ලේඛන ක්‍රමයක් පැවැති බවයි. සාහිත්‍යකෘති වශයෙන් වැදගත්කමක් ඇති රචනා ඒ අතර ඇත්තේ ටිකකි. සෙල්ලිපි වුවද වැඩි වශයෙන් සැලැකිය හැක්කේ සිංහල භාෂා ඉතිහාසය හා සංවර්ධනය හේරුම් කිරීමටය. සාහිත්‍ය විෂයයෙහි වැදගත් ලෙස ඔබිය යුතු රචනා දෙකොටසක් වය. ඉන් එකක් අප අතට පත්ව ඇත. අනෙක නෂ්ටප්‍රාප්ත වය. අප අතට පත්ව ඇති ලේඛන නම් සිගිරි කැටපත් පවුරුවල කුරුටු හා සිඛෙන පද්‍ය. ඒ වනාහි සිංහල පද්‍ය වලිය නමැති ප්‍රභූ වංශයෙහි අහන ප්‍රභූ ඇවයි. අපට අද කියවා බැලීමට නොහැකි රචනා හෙළ'ටුවාපෙළයි."

(ආනන්ද කුලසූරිය , සිංහල සාහිත්‍ය-1 , සමන් මුද්‍රණාලය , 3 වන මුද්‍රණය 1963 , මහරගම . 43 වන පිටුව .)

1. Although යට generally means 'beneath, below', it is sometimes used in discourse, as here, as an alternate for 'preceding, above'.

10

" ඉතිහාස ග්‍රන්ථයකින් බොහෝදෙනා සාමාන්‍යයෙන් බලාදොරොත්තු වන්නේ රටක රජුන් රාජ්‍යශ්‍රියට පැමිණ වකවානුත් ඒ රජුන්ගේ වංශපරම්පරා ආදියත් ඒ රජුන් කල සිදු වූ ප්‍රධාන සිද්ධීන් පිළිබඳ තොරතුරුත් විස්තර කිරීමෙකි. එහෙත් එය ඒ පමණින් ඉතිහාස ග්‍රන්ථයක් නොවේ. ඉතිහාස ග්‍රන්ථයක් වූ කලී යම් කිසි රටක එක්තරා කාල පරිච්ඡේදයකට අයත් සමාජයක විවරණයකි. එවක විසූ පුද්ගලයන් මෙන්ම ක්‍රියාත්මකව පැවති බලවේගයන්ද සිදු වූ විවිධ සටනාවන්ද අවශ්‍යයෙන්ම ඊට ඇතුළත් වුවමනාය. සාහිත්‍ය ඉතිහාසයක දිද සාහිත්‍යකරුවන් පහළ වූ සාමාජික හා දේශපාලන පරිසරය, එවක පැවති බලවේග හා සිතුම් පැතුම් ආදිය තත් වූ පරිද්දෙන් අවබෝධකර ගැනීමට එය අතිශයින් උපකාරී විය යුතුයි."

(ඩී. ඊ. හෙට්ටිආරච්චි, ආනන්ද කුලසූරියගේ සිංහල සාහිත්‍යය-1 , සමන් මුද්‍රණාලය , 3 වන මුද්‍රණය , 1963 , මහරගම . 48 වන පිටුව.)

11

"නානාප්‍රකාර වර්ණභෙද ජාතිභෙද පක්ෂිභෙද කුලමලභෙද ආදියෙන් භෙදඉන්නව විෂමව පැවතුණුවුද, පරම්පරාගත මිථ්‍යාමතවල හා විෂම සිරිත් විරිත්වල ඇලී ගැලී ඒවා ජීවිතය මෙන් ආරූඪ කළා වුද, ඒ සමාජයෙහි ශබ්දයේ දෙනෙකුට, බුදුරජාණන්වහන්සේ විසින් එහි කුලභෙද ආදියටත් මිථ්‍යාමතවලටත් නිර්දය ලෙස පහර වදින සේ දෙශනා කළ ඒ එවැනි දෙශනා - ඒ උත්තම ධර්ම වචන මෙන් අප්‍රිය විය. ඒ නිසාම උන්වහන්සේට නොයෙක් වාරවල නානාවිට භයානක බරපතළ කරදර අවස්ථාවලට ද මුණ පාන්නට සිදුවිය."

(යක්ඛවුවේ ප්‍රඥරාම සථවිර , සඟබණ 1 , මැදුම් සඟිය 1 , විද්‍යාලඞ්කාර මුද්‍රණාලය , 1957 , කැළණිය . 7 වන පිටුව.)

12

" එක්තරා මහවනයෙක්හි සාගින්න නිසා වියලී ගිය උගුරක් ඇති සිවලෙක් වාසය කෙළේය. දරාගත නොහැකි ක්ෂුධාවෙන් පරිපීඩිත වූ හෙතෙම ඔබනොබ සංචාරය කරමින් එම වනයෙහි පිහිටි යුඬභූමියක් කරා පැමිණියේය. එහිදී ඔහුට යුඬභූමියේ මද්ධ්‍යභාගයෙන් අසන්නට ලැබුනේ කණිනටුකදු බිහිසුණු ශබ්දයකි. සිවලුතෙමේ මේ මහා ධ්වනියෙන් තැතිගත්තේය.

' අහෝ නටුයෙනි !' යි හෙතෙම භය සන්ත්‍රාසයෙන් යුක්තව පවසා ' අහෝ නටුයෙනි, මගේ ජීවිතය ආපදාපන්නය. මා දැන් මෘතදෙහයකට සමානය. එහෙත් මේ මහ හඬ නගන්නේ කවරෙක්ද ? ඔහු කෙබඳු සතෙක් දැ?' යි තමාගෙන්ම විමසුවේය.

මෙසේ තමන්ගෙන්ම විමසූ සිවලා හඬ නැගෙන දෙස සෝදිසි සහිතව බැලූ කල්හි ගිරිඔසක් බඳු වූ මහ යුද බෙරයක් දකින්නට ලැබිණ. "

(හේමපාල මුනිදාස , පංචතන්ත්‍රය (පරිවර්තනය) , සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම , 1955 කොළඹ. 30 වන පිටුව.)

13

" පසුව දු උදැසන, නායක සෙනෙවි තෙමේ අසඹ පැමිණෙන තෙක් උදක් බලාපොරොත්තුව සිටියේය. දිනපතා හැම උදැසනක, නායක සෙනෙවියන්ගේ වාසභවනයට පැමිණ, නාගරික වෙළෙඳුම හා සාමය ගැන ඇති තතු වාර්තාකොට, කාර්යාකාර්ය නිශ්චයකොටගෙන, බලාබල නිර්ණයෙන් උපදෙස් ලබා, කටයුතු පිණිස පිටත්ව යෑම අසඹයන්ගේ සිරිත විය. ගත වූ දින අසඹයන්හට පැවරුණේ, වග කිය යුතු වැඩකි - එ මෙන්ම අන්තරායදායක වැඩකි. කිමෙන්ද යත්,[1] වරපුරුෂයකු ප්‍රහාරණය කිරීම ලෙහෙසි පහසු වැඩක් නොවන හෙයින් විශෙෂයෙන් එවැනි කාලයක, එසේ කිරීම ඉතාම අපහසු විය."

(ඩබ්ලියු. ඒ. සිල්වා , විජයබාකොල්ලය , සිමාසහිත මාතර වෙළෙන්දේ මුද්‍රණාලය , 10 වන මුද්‍රණය, 1961 . 5 වන පිටුව.)

1. කිමෙන්ද යත් has the sense 'that is to say, to wit'. A Colloquial equivalent is මොකද්ද or මොකද කියවනවා .

" 'ඉදින් පියාණෙනි, තුමස් නිසා ඔබ දැන් උස්වැටෙහි දැයි ?'
මෙසිදී නිලමණි ප්‍රශ්න කළාය.

'ලේ වැගිරීම් සතුටට කාරණයක් නොවෙයි, දියණිය.'

'ඉදින් මේ බත්තුකාරයා ? ඔහු සොයා ගත නොහැකි වී දැයි ?'
දෙවිය ප්‍රශ්න කළාය.

'තවම ඒ කරඟත නොහැකි විය. මම අසඬහයන් ඒ කාරියෙහි යෙදුවෙමැයි,' නායක සෙනෙවි කීයේය.

'අනේ! ඒ දරුවා ඊට කෙසේ කරම් වේ දැයි ?' කියා විඳුනරා දියණියන් පුහුණ බැලුවාය.

'මතු යස ඉසුරු හා රාජ වරප්‍රසාද ලබන්නා කැටැති කරුණයන් යෙදිය යුතු ඔවැනි වැඩවල තමා. අසඬ ශූරයෙකි. ඔහු කෙරේ මගේ බලවත් විශ්වාසය පවතී,'යයි සෙනෙවි කීයේය.

මෙසිදී නිලමණි තුමරියගේ පුහුණ යොවනොද්භෙදයෙන් බබළන්නට විය. ඔලංවේ දැල්වෙන ප්‍රදීපාලෝකයෙන් ඒ බව දෙමව්පියනටද[1] පෙනිණි. එහෙයින් ඔවුහු, එය තවත් සංලාපය නතරකොට, වෙන අන් දෙය ගැන කතා බහ කළාහ. "

(ඩබ්ලිව්. ඒ. සිල්වා , විජයබාකොල්ලය , සිරිසඟබෝ මාතර වෙළෙන්දේ
මුද්‍රණාලය , 10 වන මුද්‍රණය 1961 . 4 වන පිටුව.)

1. දෙමව්පියනට is an alternate for දෙමව්පියන්ට . This -අට (for -ට) alternate for the dative is usually found in Classical Sinhala.

15

" මේ රටේ සමුපකාර කඩ සමිති ක්‍රමය ප්‍රතිසංවිධාන කිරීම සඳහා දැන් ගනුදෙනු යොදුහෙන යන බව පෙනේ. එම කඩ සමිති ක්‍රමය පිළිබඳව ප්‍රතිසංවිධානයක් අත්‍යවශ්‍යව ඇති බව කාටත් පැහැදිලි කරුණකි. පාරිභෝගිකයාගේ යහපත මුලික කරගෙන ආරම්භ කරන ලද මේ ව්‍යාපාරයෙන් බලාපොරොත්තු ප්‍රතිඵල ලැබී නැති බවද පැහැදිලිය. දූෂණය, අකාර්යක්ෂමතාව, උදාසීනබව හා ගනුසැලකිල්ල වැනි නොයෙකුත් හේතූන් එම ව්‍යාපාරයේ සාර්ථක බව කෙරෙහි බාධකවලයෙන් ඵලපා ඇති බවද රහසක් නොවේ.

සමුපකාර කඩ සංවිධි ව්‍යාපාරයෙන් නිසි සේවය ඉටුකරවාලීම සඳහා එය ප්‍රතිසංවිධාන කරලීමෙහි රජය පියවර ගැනීම ප්‍රශංසනීය කාර්යකි. මෙහිදී මුල්තැනට ගත යුතු එක් විශේෂ කරුණක් ඇත. එනම් සමුපකාරය ප්‍රතිසංවිධාන කළ යුත්තේ පාරිභෝගිකයාගේ යහපත මුලික කරගෙන බවයි. "

(දිනමිණ කතෘමණ්ඩලය , ලේක් හවුස් , වර්ෂ 1971 ජූලි මස 28 වැනි බදාදා , කොළඹ.)

16

" ආදිම සඳෙඟකාව්‍යය නොහොත් දූත කාව්‍යය නම් කාලිදාස මහකිවියන් විසින් සංස්කෘතඥෝක 118කින් කරන ලද මෙසදූතයයි. සංස්කෘත සඳෙඟකාව්‍යයක් මෙසදූතයෙන් ඇදුණ ගත හැකි ය. එහෙයින් මෙසදූතය පිළිබඳ සඩෙඟප විසතරයක් හා එහි කථාශරීරය මෙහි දක්වමු. අලකාපුරයෙහි කුවෙර නම් දෙවියාගේ මෙහෙකරු වූ යක්ෂයෙක් සවකීය කාන්තියෙහි ප්‍රමත්ත වූ හෙයින් වුරුද්දක් කල් ප්‍රියාවඟෙන් වෙන්ව රාමගිරි අසපුවෙහි කල් යැවීමට ආඥාදුණුවේ ඒ විරහ කාලයෙන් අටමසක් කල්ගතකොට වර්ෂාකාලය පැමිණෙන කල්හි තමාගේ භාර්යාව මෙනෙහි කොට ඇ වෙත හසුනක් යවන පිණිස සඳෙඟහාරකයකු සොයන්නේ දකුණ දිහාභාගයට යන්නා වූ මෙසයක් දැක ඊට ආමන්ත්‍රණයකොට සවප්‍රියාවට තමා ජීවත්ව ඉන්නා බවත් මෙ වූ මාස සහර කෙදේ නුමුත් ගතකොට නැවත ඇ කරා එන බවත් දන්වන ලෙස අයැද ඉක්බිති මෙසයා විසින් යා යුතු මාර්ගය විසතර කරයි. මාර්ග වර්ණනාවට අනතුරුව කුවේරයාගේ අලකාපුරයෙහි වර්ණනාව වේ. ඉක්බිති යක්ෂ භාර්යාව විරහ අවස්ථාව ගත කරන අඳම විසතර කරන ලදි. ඊ ළඟට යක්ෂයාගේ හසුන ප්‍රියාවට කියන්නේය. සඳෙඟහාරක මෙසයාට ආශීර්වාදයකින් දූතකාව්‍යය අවසාන වෙයි. "

(සි. ඊ. ගොඩකුඹුරේ , හංසසඳෙඟය (සංස්කරණය) සිමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම , 1953 , කොළඹ . 1 සහ 2 වන පිටු , ප්‍රකාශකාව.)

17

"ලොකයෙහි ප්‍රථම සඳෙහ කාව්‍යය නිපැදැවීමේ ගෞරවය මහාකවි කාලිදාසයනට යෙයි. ඔහු ඒ සඳෙහයට කථා වස්තුවක් නිර්මාණය කළහ.

අලකායෙහි කුවේරයන්ගේ සෙවයෙහි නියුක්ත වූ යක්ෂයෙක් වී. සවාමි සේවයෙහි ප්‍රමාදය දැක්වූ ඔහුට ඇවර තෙමේ 'පුරා වසියක් නගරයෙන් බැහැරි වෙසේව'යි[1] ශාප කෙළේ යැ.[2] එයින් තමාගේ අභිනව ප්‍රිය භාර්යාවද හැරියන්නට සිදුවූ තරුණ යක්ෂයා, රාමගිරි නම් ආශ්‍රමයෙහි මාස කිපයක් මහත් දුකින් විසි යැ."

(කුමාරතුංග මුනිදාස , මයුර සඳෙහය (සංස්කරණය)- සීමාසහිත ගුණසේන සහ සමාගම 2 වන මුද්‍රණය , 1963 , කොළඹ . ප්‍රස්තාවනාව .)

1. Alternate for වෙසෙවි (imperative of වසනවා).
2. Alternate for ය as predication marker and verbal ending.

18

" බණ්ඩාරනායක මහතා අගමැතිවීමෙන් පසු රට හැර ගිය එම් පුද්ගලයෙක් පිටරටදී අවැරැවේ වැටුනි. මෙසේ සිටින කළ අගමැතිතුමා ඒ පුද්ගලයා විසු රටට ගියේය. එහිදී ඔහු ගැන තොපතුරු දැනගත් අගමැතිතුමා අමාරු තත්ත්වයෙන් ගලවාගැනීමට හැකි හැම උපකාරයක්ම කරන ලෙස නිවැරදිකරුවන්ට කිවේය.

මෙහි සිටියදී හැකි තරම් තමාට අතුරුකම් කළා වුද තමා අගමැතිවීමත් සමග රටෙන් එපාවීමට තරම් තමන්ට ද්වේෂ කළා වුද ඔහුට උදව් උපකාර කිරීවිරා ගියේ මන් දැ යි අගමැතිතුමා සිය රට පැමිණි පසු ගිනවත්තු ප්‍රශ්න කළහ.

' මිනිහට හෘදය සාක්ෂියක් තිබේ නම් මා මෙක්වෙන මෙන්වෙන වහාවම ඔහුට තිබේ වේදනාවක් ඇතිවෙනවා ඇති. මගේ අතුරන්ගෙන් පලිගැනීමට ඊට වඩා මගක් මං දන්නේ නැති නිසා අමාරුවේදී උපකාර කරනවා'යැයි බණ්ඩාරනායක මහතා පිළිතුරු දුන්නේය. ' "

(විමුක්තියේ නියමුවා , ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශනයකි , 1970 . 83 වන පිටුව .)

19

" බලාපොරොත්තු සහිත කාල පරිච්ඡේදයක් උදාවී තිබෙද්දී භයඞ්කර විපතකට සිංහල භාෂාව හා අනෙක් පෙරදිග් ශාස්ත්‍රද ගොදුරු වුහ. මේ[1] වනාහි අනෙකක් නොව පිතෘකාතක දෙවනරාජසිංහ මහිපාලයාණන්ගේ ප්‍රචණ්ඩ ක්‍රියාවෙකි. සඩ්ඝයාවහන්සේලා සමඟ නිෂ්කාරණයේ කිපුණු නරපති තෙමේ ඔවුන්ගෙන් පළිගනිමි යි යන දුෂ්ට චෙතනාවෙන් තමනට අපු වූ යම් පොතපතක් විද, ඒ සියල්ල එක්තැන් කොට ගිනිදෙවියාට පූජා කෙළේය. මේ අශොභන ක්‍රියාව නොවී නම් අද සමස්ත ලොකයෙහි අන්‍ය කිසිම ජාතියකට අඩු නොවන තරම් වූ ගද්‍යවුද පද්‍යවුද සාහිත්‍ය ග්‍රන්ථ රත්නාවලියකින් සිරි ලඞ්කාමාතාවගේ ග්‍රීවය බැබැළෙන්නට තුබුනි. යළිත් ශාස්ත්‍රා ලෝකය අතුරුදහන් විය. "

(ජේ. ලයනල්. ඩබ්ලිව්. ද සිල්වා , වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ සිදාසහිත ඇමී. ඩී. ගුණසේන සහ සමාගම , 1 වන භාගය , 1948 , කොළඹ. 8 වන පිටුව.)

1. Although මේ is generally animate, it refers here to විපත in the preceding sentence.

20

" පෙර බරණැස බ්‍රහ්මදත්ත නම් රජතෙමේ රාජ්‍යය කරන කල්හි හිමාලයෙහි වූ බොහෝ අතවැසි කවුසන් පිරිවරාගත් තාපසයෙක් උනු ඇඹුල් පිණ්ඩ බරණැසට ආයේ උපාසකවරුන්ගේ ආරාධනාව පරිදි එහිම වස් විසූහ. ඔවුන් දිනපතා පිඩු සිඟා ගිය විට එක්තරා වඳුරෙක් එම පන්සලට පැමිණ සියළු බඩු ඇද පැන් බඳුන් බිඳ හැමතැන මළ මුත්‍රකොට යන්නේය.[1] දිනපතාම මෙසේ සිදුවිය. වස් තුන් මස අවසානෑ තාපසවරු හිමාලයට යාමට උවමනා බව උපාසකවරුන්ට දැන්වුයෙන් උපාසකවරු එක් වී එදින දන් පිළිගැන්වීමට පන්සලට ගෙනාහ. වඳුරා සිතන්නේ මා අද ඉතා ගානව සිට මේ ආහාර කන්ට උවමනා යයි සිතා පසෙකට වී ඉර දෙස බලා උන්නේය. මේ දුටු උපාසකවරු ඌට සතුරු කළහ. තාපසවරු කියන්නාහු උපාසකයෙනි! මේ වඳුරා අපට මෙතෙක් කල් නොයෙක් හැඟැටකොට අද පමණක් මෙසේ සිටින්නේ උපායකින් මේ ආහාරපාන කෑමට යයි පෙර කළ සියළු හිරිහැර කිහ. එයින් කිපුණු උපාසකවරු දඬු මුගුරෙන ගසා වඳුරා එළවා දැමූහ. තාපසවරු දන් වළඳා හිමාලයට වැඩියහ. "

(එච්. ඩබ්ලිව්. නිමල් ප්‍රේමතිලක , පන්සියපනස් ජාතක පොත (සංස්කරණය) ශ්‍රී සුවරිතෝදය සඟමිදුන සමිතිය , 170 ආදිවඩුපඬුන ජාතකය , 1963 , බණ්ඩාරගම. 248 වන පිටුව .)

1. The future tense is used here to indicate continual or habitual action in the past.

21

"සිවිල් නිලධාරීන්ගේ විභාගයෙන් ජය නොගත්තොත් මාලින්ට තමාගේ ව්‍යාපාරය පුහුණුකරන අදහසින් කබලාන ඔහු එංගලන්තයට යැවුවේ. තම පුත්‍රයා හතර අවුරුද්දකට පසු ගමට එන්නේ සිවිල් නිලධාරියකු ලෙස නොව ඉහිසාසය හා අරීඝාසත්‍රය උගත් ඉර උපාධිධාරියකු ලෙස ය. මාලින් සිවිල් නිලධාරීන්ගේ විභාගය නොගත්තේ එයින් ජයගැනීම අධාරු යයි සිතූ නිසා නොවේ. පියාට අකීකරු වී මෙන් තම අදිනැඹය දක්වන්ට සිතූ නිසා ය. පුදු නිලධාරීන් යට වැඩ කිරීමද ඔහුට ප්‍රිය නොවිය. අර්ථශාස්ත්‍රය උගතකුවීම නිසා මාලින් වඩාත් ඉර කම්කරු ඔපියකු වෙයි[1] කබලාන සිතුවේය.

මාලින්, මවුපියන්ගෙන් වියෝව එංගලන්තය බලා පිටත් වූ අවස්ථාවෙහි, කදුළු නොසැලුවේය."

(මාර්ටින් වික්‍රමසිංහ , යුගාන්තය , වැස්ලි මුද්‍රණාලය , 7 වන මුද්‍රණය , 1964 , වැල්ලවත්ත. 13 වන පිටුව.)

1. The plural verb may be used with a subject in the accusative (singular or plural) to indicate doubt or anticipation.

22

" ඔරලෝසි- මොහෝරිය ආදිය සාදන්නේ ඒවා පාවිච්චි කළ හැකි කාලය මෙපමණයයි සාමාන්‍යයෙන් කියති. ඊ ඛවු සාදන්නන්ටද, ඒවා පවත්නා කාලය අනියම් වශයෙන් කිය හැක. මෙසේ සාදන සැදෙන හැම දේකම ඇති ප්‍රමාණයක් තිබේ. ඒ ඇතිය ගෙවෙන විට ඒවා දිරාපත් වෙති, වැඩකට නැත නොහැකි වෙති. ඒ ඒ භවයන්හි උපදින සත්වයන්ටද කර්මඥති ප්‍රමාණයක්- තිබේ, ඒ ඇති ප්‍රමාණය හෝ පවත්නා කාල ප්‍රමාණය ගෙවී යන විට ඔවුන්ගේ මරණය සිදුවෙයි. 'ආයුසංස්කාරය'යි කියනු ලබන්නේ මෙයටයි. මේ ඇති ප්‍රමාණය තෙක් ජීවත්වය හැක්කේ අතරේදී අනතුරක් විපතක් සිදු නොවුවොත්ය. හදිසි අනතුරකින් කර්මඥතිය මඟදී බිඳි යා හැක. "

(පොල්වත්තේ බුද්ධදත්ත මහානායක ස්ථවිර , ථෙරවාද බෞද්ධ දර්ශනය ,
අනුල මුද්‍රණාලය , 2 වන භාගය , 1961 , මරදාන . 231 වන පිටුව .)

23

" ඉවර යුගයට පැමිණෙන්න පෙර ද්‍රවිඩ ආභාෂය ලැබූ ග්‍රන්ථයක් ලෙස නම් සළ හැක්කේ සිදත්සඟරුවයි.

පාළි සංස්කෘත භාෂාවන්ගෙන් ගත් නිති රිති ආදිය ඇතත් මේ ග්‍රන්ථයේ සැලැස්මත් සමඟර අදහස්ත් ද්‍රවිඩ සාහිත්‍යයෙන් ගෙන තිබේ. මෙය විවරණ ග්‍රන්ථයක්ම නොවේ. මෙහි ප්‍රධාන අදහස කාව්‍ය රචනයට උපදෙස්දීමයි. විවරණ නිති රිතිත් කාව්‍යලංකාරත් එක් කොට ගෙන ඇති මෙවැනිම ද්‍රවිඩ ග්‍රන්ථයක් දකුණු ඉන්දියාවේ තිබේ. ඒ ග්‍රන්ථයම ගුරුකොට ගන්නට ඇතැයි සිතීමටද හේතු නැත්තේ නොවේ. ' විරසොළියම් ' යනු ඒ ග්‍රන්ථයේ නමයි. "

(බද්දේගම විමලවංස ස්ථවිර , සිංහල ග්‍රන්ථ විචාරය , අනුල මුද්‍රණාලය , 1960 , මරදාන . 56 වන පිටුව .)

24

" මඹියා එතැනින්ද ගොස් දෙපස ගෙවතුවලින් ගහන විථියකට පිළිපන්නේ ඒ එස් වත්තෙක පිහිටි තනිමාලයේ ගෑමී ගෙයක්ද ඒ අසලම කුඩා මඩුවක්ද දුටුවේය. ගෙතෙම ගෙට ළංවී කවුළුවෙක පොදු අතරින් එබ ඇතුළ බැලිය. ඔහුගේ දෘෂ්ටිපථයට අසුවූයේ ප්‍රදීපාලෝකය පැතිරී ඔය අලඩාර කාමරයෙකි. මල්රෙදි ඇතිරිල්ලක් සහිත ඇඳෙක්ද තොටිල්ලෙක්ද එහි පසෙක විය. බිත්තියේ එල්ලා තුබුණු කානු දෙකේ තුවක්කුවක්ද තේ දිටි. කාමරය මැද මේසයක් කැම පිළියෙළ වී තුබුණේය. පසක් සිහින් බදවැඩී ගතලිස් හැවිරිදි පමණ වයසැති පුරුෂයකු මේසයට වාඩිවී දණෙහි දරුවකු පදවමින් ප්‍රීතිවනුද පෙනිණි. යොවුන් බව තවමත් නොලබම්ම වූ බිරිය අත දරුවාට කිරි දෙමින් වෙතම හුන්නාය. "

(අයි. ඇම්. ආර්. ඒ. ඒරියගොල්ල , මනුකාපය , 7 වන මුද්‍රණය , 22 වන පිටුව.)

25

" සිංහලයන්ගේ භාෂාව වනාහි සිඟු ආර්‍ය භාෂාගණයට අයත් වූවකි. මහාවංශයෙහි සඳහන් පරිදි සිංහලයෝ සමුදුධපරිනිර්‍වාණ දිනයෙහි උතුරු දඹදිවින් ලක්දිවට පැමිණි ආර්‍යවර්‍ගයාගෙන් පැවැතෙන්නෝ වෙති. සිංහලයන් බුදුසසුනියන් වීමට පෙර ඔවුන්ගේ භාෂාවෙහි ආදිම අවස්ථාව පිළිබඳ තත්ත්‍වය දැනගැනීමට ඉවහල්වන ලිපියක් මේතාක් හමු නොවිය. දැනට සොයාගෙන තිබෙන ඉතාමත් පැරණි, ලියු කාලය නිශ්චයකට හැකි, ලිපිය වනාහි ශ්‍රී බුදුවර්ෂ 277දී ලක්රජයට පත් උත්තිය නිරිඳුගේ කාලයට අයත් කුඩා ඔල්ලෙන් ලිපියකි. ඉන්පසු ක්‍රිස්තුවර්ෂාරම්භයට පෙර ලඬාරාජ්‍යශ්‍රියට පැමිණි දුටුගැමුණු ආදි නරවරයන්ගේ කාලයන්හි කරවූ කුඩා සෙල්ලිපි කිපයක්ද අපට ඇත්තේය. මේ බ්‍රාහ්මී ශිලා ලෙඛනයන්හි පෙනෙන භාෂාවට බෙහෙවින් සමාන ප්‍රාකෘතභාෂාවක් සිංහල ජාතියේ ආදි පුරුෂයන් කථාකළ බව සිතීම නිවැරදිය. "

(වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ, ශ්‍රී සුමඩාල ඔඛද කොෂය මහඔටි යන්ත්‍රාලය, මාලිගාකන්ද , කොළඹ. සඳහනය 5 වන පිටුව .)

26

" ඔවස තුනට පමණ ඔවුහු ගාල්ලට ළඟා වුහ. එක් පැත්තකින් බිලන්ද පවුරෙනුත් අනිත් පැත්තෙන් රුමස්සල කඳුගැටයෙනුත් සෙවණවුණු ගාලුවරාය ඉහා දැකුම්කලු කරදිය කඩඉම. මේ කරදිය කඩෙහි සුන්දරත්වය වැඩිවන්නේ කොළඹවරායෙහි මෙන් නැව්, යාත්‍රා, සුළඟ නොවන බැවිනියි අරවින්ද සිතුවේය.

' කොටුව ඇතුළත් බලා යමු 'යි අරවින්ද කීය.

රියකරු අලුත් කොටු දොරටුවෙන් ඇතුළුව රිය පදවාගෙන ගොස් පරණ කොටු දොරටුවෙන් පිට විය. ගාලු වරායේ සුන්දරත්වය කෙලෙසිටිම නැතුණු මවුවක් වැනි මාළු කඩය අසලින් ඔය මොහෝරියේ උන් අරවින්දගේ පමණක් නොව අනුයන්ගේද නාස්පුඩු ඇකිළිණ. මෙතරම් සුන්දර වරායක් සහිත ගාලු නගරයේ කැතකම වඩාත් පෙනෙන්නේද වරායට පිටුපා පිහිටි ගරාවැටුණු ගෙවල පැළදොරවල් බලා මේ පාරෙන් ගමන් කරන්නන්ට ය. "

(මාර්ටින් වික්‍රමසිංහ , යුගාන්තය , වැස්ලි මුද්‍රණාලය , 7 වන මුද්‍රණය , 1964 , වැල්ලවත්ත. 47 වන පිටුව.)

27

" ' රෝහිණි නුඹ මිත්‍ර සෙනෙවිය ආරක්ෂාකරගැනීමේ රිසියෙන් මා වළකන්ට හදනවා නොවේද? 'යි කෝපයට පත් අතුල විමසූවේය.

'නුඹ ඔයතරම් ශූරයෙකැයි කියන ඔහු මගෙන් මැරුම් කන්නේ නැද්දැයි නුඹට බලාගතහැකි. ඔහු ගළවාගන්ට ඔයතරම් වුවමනා නම්, මා හා සටනට එන්ට එපාය කියා ඔහු වළකා ගනින් ! '

ඈ එයින් උරණ නොවී, සටනට නොයන ලෙස නැවත නැවතත් අතුලට යාච්ඤා කළාය.

'රෝහිණි මා හැමටම එපාවුණු එකෙක්. මට මවක් නැත. පියෙක් නැත. නුඹ කවු සිල්පයෙහි සමතෙකැයි කියන මිත්‍රසෙනෙවියාගෙන් මැරුම් කැවත් මා ගැන හොඳවන්ට කිසිවෙක් නැත. මිත්‍ර සෙනෙවියාගේ අයුතුකම් නිසා මට සිටි එකම හිතවතා නැතිවිය. මිත්‍ර කළ අපරාධයද මම සියැසින් දුටුවෙමි. එහෙයින් ඔහුගෙන් පළිගැනීමට මෙය මට හොඳ ප්‍රසාදයකි. ඔහු හා මෙසේ සටන් කරන්ට ලැබීම ගැන මම සතුටුවෙමි. ඔහු හා සටන්කොට මියයන්ට මා අදහස් කෙළේ ඔහු මට කවුවුණු පළවු දවසේමය. එදා මගේ මිත්‍රයා මා ඉන් වැළකුවේය.' "

(මාර්ටින් වික්‍රමසිංහ, රෝහිණි , සමන් මුද්‍රණාලය, 24 වන මුද්‍රණය , 1956, මහරගම. 77 වන පිටුව.)

GLOSSARY

The form of entries is the same as for Literary Sinhala. Numbers in parentheses refer to the number of the section in which the form first occurs.

අංක number (3)

අංගය N2 feature, part, limb, characteristic; pl. අංග (animate pl. අංගයෝ) (8)

අකාර්යක්ෂමතාව N2 inefficiency; pl. අකාර්යක්ෂමතා (15)

අකීකරු disobedient (21)

අගනා valuable (8)

අටුවාව a commentary on a text (Pali අට්ඨකථා) (2)

අඩුනොවන තරම් not less than, not second to (19)

අත දරුවා N5 babe in arms, infant; pl. අත දරුවෝ (24)

අතරින් from among, through, in between, from the midst (6)

අතවැසියා N5 servant, assistant, student; pl. අතවැසියෝ (20)

අතිශයින් greatly, excessively (10)

අතුරුදහන් වෙනවා disappear (19)

අතුරුවැද්ද N2 place name (3)

අදිය N5 name of a person (27)

අත්‍යාවශ්‍ය very necessary (15)

අදිනවා disarrange, mess up, pull (20)

අද්විත්වය N2 individuality, independence; pl. අද්විත්ව (21)

අනෙක්ක inactive, dormant, defunct, improper (8)

අදෘශ්‍යමාන unseen, invisible (5)

අනියම් indefinite, doubtful (22)

අනුන් other people (oblique plural of අන්‍ය) (5)

අපේ oh, alas (14)

අන් other (5)

අන්තරාදායක dangerous, risky (13)

අන්තර්ධානය N2 disappearance; no pl. (2)

අන්තිමට last, at last (2)

අන්දම N2 mode, manner; no pl. (16)

අන N5 other person; pl. අනයෝ (26)

අන other (19)

අපරාධය N2 crime; pl. අපරාධ (27)

අප්‍රිය disagreeable, displeasing (11)

අබියස in front (7)

අභිවෘද්ධිකාමී eager for prosperity (1)

අයැදිනවා beg, request (16)

අයුතුකම N2 improper deed, unjust deed, injustice; pl. - කම් (27)

අරවින්ද name of a person (26)

අලංකාරය N2 adornment, ornament, embellishment; pl. අලංකාර (23)

අලකාපුරය N2 Alakā, mythical city of the god Kuvera; no pl. (16)

අලකාව N2 same as අලකාපුරය (17)

අලංකාර beautiful, ornate, decorated (24)

අවශ්‍යයෙන්ම necessarily (10)

අවසානෑ at the end (20)

අවහිරය N2 obstacle, impediment; pl. අවහිර (3)

අශීතානුව්‍යඤ්ජන Npl. the 80 subcharacteristics of the Buddha's person (7)

අශෝභන unseemly, ugly (19)

අසඩිත name of a person (13)

අසන්නා N5 listener, hearer; pl. අසන්නෝ (7)

අසුව N2 monastery, resting place; pl. අසු (16)

අසල near(by), vicinity (24)

අල්ලාගන්නවා bring into focus, catch, entrap (7)

අල්ලාහිඳිනවා take seats, sit (6)

අල්ලෙනවා fall within one's grasp (19)

අහෝ oh, alas (12)

ආඥව N2 order; pl. ආඥා (16)

ආදි early, ancient, former (8)

ආදිච්චුපට්ඨාන ජාතකය N2 name of a Jātaka (the Sun Worshipper Jātaka) (20)

ආදිම oldest, earliest (16)

ආපදාපත්ත subject to danger (12)

ආභාෂය N2 influence, introduction; pl. ආභාෂ (23)

ආමන්ත්‍රණය කරනවා address (16)

ආයුසංස්කාරය N2 constituents of life; no pl. (22)

ආරක්ෂාකරගැනීම N2 protection; pl. - ගැනීම් (27)

ආරාධනාව N2 invitation; pl. ආරාධනා (20)

ආශ්‍රමය N2 ashram, hermitage, retreat; pl. ආශ්‍රම (17)

උපන්දගන්නවා develop in oneself, raise for oneself (1)

උපුටිල්ල N2 coverlet; pl. උපුටි (24)

උඳුව internal (8)

උඳුවනවා / වෙනවා enter (26)

උඳ N2 bed; pl. උඳෝ , උඳවල් (24)

උළු (adj) sour; (Npl) curry ingredients such as lime (20)

උඩඇදී being caught up in, clinging to, submerged in (11)

උවිඳ ppl. of වනවා (6)

(x) උවිඳිදි X years old (1)

ඉක්බිති after that, next to that, next (16)

ඉක්මවනවා pass, exceed (24)

ඉටුකරගැනීම N2 getting something fulfilled, carried out; pl. .... ඉටුකරගැනීම් (15)

ඉතා extremely (13)

ඉඳුරැව N2 place name (3)

